

# සංක්‍රමණිකයකුගේ සටහන

## වර්ණ ධාතු

වෙසක් කාලය ගෙවී ගිහින් පොසොන් කාලය උදා වෙලා. අප සමරන්නේ මිහිඳු හිමිගේ ලංකාගමනය. එය අපේ ඉතිහාසයේ පළමු තීරාණාත්මක කඩඉමයි. එහි බලපෑම වසර දෙදහස් පන්සිය ගණනක් තිස්සේ අදටත් පවතිනවා. ඉදිරියටත් ගලා යාවි. ඒ බුදු දහම යනු පුද්ගලයන් අදහන ආගමක් නොව ගුණධර්ම චර්යාවන් අදහන ආගමක් වීමයි. බුද්ධ දර්ශනය යනු මෙලොව මිනිසුනට ජීවත් වීමට ඇති හොඳම ක්‍රමයයි. මේ දහම ලොව පැතිරවීම සඳහා බුදුන් වහන්සේ විසින් කොපමණ දුරක් චාරිකා කරන්නට ඇද්දැයි අප ප්‍රායෝගිකව අත් දුටුයේ ඉන්දියාවේ බුදුන් විසූ පෙදෙසෙහි එක් නුවරක සිට තවත් නුවරකට මගී බසයකින් කි.මී. 200 ක් දුර යාමේදී අප විඳි වෙහෙස නිසාය. මේ සා දුරක් දෙපයින් ගමන් කරමින් තවුසන්, බමුණන්, ගුරුකුලවාදීන් හා ගැටෙමින් තර්ක කොට ස්වකීය ධර්මයෙන් ගොඩ නැගූ දහම පිළිබඳව දැඩි සංවේගයක් ඇති වූයේ පසුගිය දා මෙල්බන් ගුවන් විදුලියකින් ධාතු ප්‍රදර්ශනයක් ගැන කෙරුණ සංවාදයකට සවන් දීමෙන් පසුවය. එහිදී ඉදිරියේදී ජනතාවට වැඳ පුදා ගැනීමට අවස්ථාව ලබා දෙන ධාතුන් ප්‍රදර්ශනයක් ගැන කෙරුණ විස්තරේදී බුදුන් වහන්සේගේ ධාතුන් සුදු පැහැයෙන්ද, සීවලී රහත් වහන්සේගේ ධාතුන් රෝස පැහැයෙන්ද, මුගලන් තෙරුණුවන්ගෙ ධාතුන් නිල් පැහැයෙන් ද යුක්ත බව සඳහන් කෙරුණා. බෞද්ධ ඉතිහාසයේ සඳහන් වන ප්‍රධානම රහතුන් වහන්සේලාගේ බාහිර ස්වරූපයන් උන් වහන්සේලාගේ ධාතුන්ට ආරෝපනය කිරීම කෙතරම් කණගාටුදායකද? භක්තිය, සද්ධාව ආගමක පැවැත්මට යම් දුරකට අවශ්‍ය නමුදු අන්ධ භක්තියට ජනතාවට හුරු කරවීමෙන් සිදුවන්නේ අනර්ථයක්ම නොවේද? විශේෂයෙන් ඔස්ට්‍රේලියාව වැනි රටක බෞද්ධයන්හට එවැනි ප්‍රකාශ මාධ්‍ය තුළින් ප්‍රකාශ කිරීම තුළ සැහැල්ලු වන්නේ දහම නොවේද? ඉතා පහළ දැනුම් මට්ටමක් පෙන්නුම් කරන එවැනි ප්‍රකාශයන් මෙවැනි රටකදී ප්‍රකාශ කිරීමේදී දෙවරක් සිතා බැලීම යහපත් නොවේදැයි අපට සිතුණා.

## වසන්තයේ ආ කාකයා

තමන්ගේ පෞද්ගලික අමනාපකම්, නොගැලපීම් පොදු තත්ත්වයන් ලෙස ගලපා ගනිමින් ප්‍රසිද්ධ වේදිකාවක සමාජගත කරන්නට උත්සාහ දැරීම කෙතරම් අශිලාචාර ද යන්න ගැන හොඳට වැටහුණේ පසුගියදා අපේ හිතවත් පුෂ්පා තිසේරා සොයුරියගේ ''ඒ වසන්තයම'' නම් මනරම් ගී සැඳෑව නැරඹීමට ගිය දවසේය. මෙල්බන් වල වෙසෙන විශිෂ්ට ගායිකාවක් වන ඇයගේ ගී සැඳෑව තුළ අප සියළු දෙනාම වින්දේ අපූරු මිහිරක්. ඒත් ඒ සොඳුරු සැඳෑව තුළ තමාගේ හැකියාව අනෙකෙකුගේ හැකියාව සැහැල්ලු කොට සැළකීමට, අර්ථ දැක්වීමට උපයෝගී කර ගැනීමට උත්සාහ දැරීම බාල වැඩක් ලෙසයි අප දකින්නේ. මේ මෙල්බන් වල වෙසෙන සීමා සහිත නිර්මාණකරුවන් ගොන්නෙහි කෙරෙන නිර්මාණයන්හට, ශිල්පීන්හට ඉරි ගසා, කොටු හදා සූත්‍රගත කර සීමාවන් පැනවීමට උත්සාහ දැරීම හාස්‍යයට කරුණක්. නිර්මාණකරණයේදී වැදගත් වන්නේ නිර්මාණය මිස නිර්මාණ ශිල්පියා, ශිල්පිණිය හෝ නිර්මාපකයාගේ තරාතිරම, ඥාති සම්බන්ධකම් නොවේ. තමන්ගේ පාලනයට අසු නොවන අනෙක් ශිල්පීන් වක්‍රව හෙළා දැකීම හා ඔවුන්ගේ හැකියාව අවතක්සේරුවට ලක් කිරීම කලා මාෆියාවකට අත වැනීමක් විය හැකිය. ප්‍රබුද්ධ සෙවනැල්ලට මුවා වෙමින් ලංකාව තුළ ද අද සිදුවෙමින් තිබෙන්නේ එයම බව නොදන්නේ කව්රුන් ද?

## ඡන්දය

නැගෙනහිර ඡන්දය අවසානයි. කැමැත්ත, අකමැත්ත කුමක් වුවද තවත් කාලයක් තමන් බලයේ සිටිය යුතුය යන දැඩි අධිෂ්ඨානයෙන් සාධාරණ සහ අපක්ෂපාතී මැතිවරණයක් වෙනුවට හොඳින් හෝ නරකින් බලය ලබා ගැනීම කල ඡන්දයක ප්‍රතිඵල දැන් කවුරු කෙසේ අර්ථ දැක් වුවත් එහි සැබෑ ප්‍රතිඵලය කුමක්ද? තමන් විසින් ග්‍රහනයෙන් මුදා නිදහස ලබා දුන් ජනතාවගේ විශ්වාසය දිනා ගැනීමට රජය අසමත්වීම පවතින ආණ්ඩුවට වඩා හොඳ ආණ්ඩුවක් ගොඩ නැගීමට තමන්ට හැකියාවක් තිබේය යන විශ්වාසය නැගෙනහිර ජනතාව තුළ ඇති කිරීමට විපක්ෂය අසමත්කම හැර නැගෙනහිර ප්‍රතිඵල අර්ථ දක්වන්නේ කෙසේද? අවසානයේ නැගෙනහිරට ලැබුණේ ඉඟුරු වෙනුවට මිරිස් ද? කළු වළාවක රිදී රේඛාවක්ද? අවි ආයුධ අත හැර ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට එක් වූ පිල්ලෙයාන් ගේ තරම අවබෝධ කරගැනීමට එතරම් කාලයක් ගත නොවනු ඇත.

## ධර්මදාස ජයසිංහ

70 දශකයේ අග භාගයේ ජවිපෙ දේශපාලන මණ්ඩල සාමාජිකයකු වූ ධර්මදාස ජයසිංහ සොයුරා ගැන දැන්නම් බොහෝ දෙනෙකුට මතක නැතුව ඇති. පසුගියදා ඔහු අපෙන් දසහටම සමුගත්තා. රූපවාහිණී ගුවන් විදුලි සේවා ආදී පහසුකම් නොමැති යුගයක ගෙන් ගෙට ඇවිද ගොස් දේශපාලනය කල පරපුරක ඔහුත් සැබෑ කොටස් කරුවෙක්. පූර්නකාලීන දේශපාලනයට යොමු වීමට පෙර ගුරුවරයකු ලෙස හා විදුහල්පතිවරයකු ලෙස සේවය කල ඔහු ඉතාම සරල සුහද මිනිසෙක්. තමන් අදහන දර්ශනය ඉතාම සරල හා ප්‍රසන්න ලෙස ජනතාව තුළට කාවැද්දවීමට ඔහුට තිබුනේ නිසඟ හැකියාවක්. දශක දෙකකට පමණ පෙර පැවති පළමු සංවර්ධන සභා මැතිවරනයේ දී ගාලු දිස්ත්‍රික්කය තුළ කැන්වසින් කල ඔහුගේ කන්ඩායමේ සාමාජිකයන් ලෙස ගිය තරුන අපට ඔහගෙන් ලැබුන ආදර්ශ නම් අපමනයි.

අපෙන් සමුගත් ඒ සරල ප්‍රසන්න මිනිසාට අපේ ආචාරය.

## ජූනි 20 - ජාතික ශිෂ්‍ය වීර දිනය

තළා පොඩි කර
හෙළා මිහි මත
දැමූ දා මල්
නොවුණ කැකුළු ද
අනේ දැනුණි ද
සුවඳ විහිදුණ
වෙළා ලක් මව්
ඇසේ කඳුල ද

හෙළා පෙති මත
සපත්තුවෙ බර
මිනිස් වෙස් ගත්
තිරිසණුන් රැළ
තලා දැමූ ඒ
කැකුළු වට බිම
බදා සිප ගම්
නොනිමි සෙනෙහෙන

සංක්‍රමණිකයා





**Palitha (Pali)**
Licenced Vehicle Tester (RWC)

**Tel 9769 1617**
Mob 0425 852 720
Fact 3/32 Cambria Rd
Keysborough Vic 3173

**ඔබේ වාහනයේ සියළු කාර්මික අවශ්‍යතා සඳහා දස වසරක ඇප කැපවීම**

Complete Service for
- Clutches
- Brakes
- Tune Ups
- All Makes
- All Models
- Computer Fault Diagnosis




**SRI LUCK AUTO P/L**


## මානවඩුගේ මාසය





**VCE**

**ENGLISH CHEMISTRY MATHS**
ACCOUNTS & ECCONOMICS

ENGLISH AND MATHS
FOR YEAR 7 TO YEAR 10

PROFESSIONAL GROUP CLASS TUTORING
IN CLAYTON
**EXPERINCED AND QUALIFIED TUTORS**

**CONTACT : 03 9545 5531**
**:04 2275 9718**